බස්නාහිර පළාත් අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යාංශය.
மேல் மாகாண கல்வி, கலாசார, கலை, விளையாட்டு மற்றும் இளைஞர் விவகார, மற்றும் தகவல் தொழில்நுட்பவியல் அமைச்சு.
Ministry of Education, Cultural and arts, Sports and Youth affairs and Information Technology - Western Province

2 වන මහල, නව පළාත් සභා කාර්යාල සංකීර්ණය, 204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
2 வது மாடி, புதிய மாகாண சபை அலுவலக வளாகம், 204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
2nd Floor, New Provincial Office Complex, 204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

07 MAR 2022

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය / எனது இலக்கம் / My Ref. | 5/10/6-2022 | ඔබේ අංකය / உமது இலக்கம் / Your Ref. | | දිනය / திகதி / Date | 2022.02 28 |

උපකුලපති,
ශ්‍රී ජයවර්ධනපුර.......... විශ්වවිද්‍යාලය

සියලු පීඨාධිපතිවරුන්
8/3

**බස්නාහිර පළාත් නිවේදන වැඩමුළුව හා තරගාවලිය 2022 - විශ්වවිද්‍යාල දැනුවත් කිරීම**

බස්නාහිර පළාත් ආධුනික නිවේදක නිවේදිකාවන් දිරිගැන්වීමේ අරමුණ ඇතිව නිවේදන වැඩමුළුවක් හා තරගාවලියක් පැවැත්වීමට බස්නාහිර පළාත් සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය සැලසුම් කර ඇත.. මෙහි විවෘත අංශය සඳහා **බස්නාහිර පළාතේ වයස අවුරුදු 20-35 අතර ස්ථිර පදිංචිකරුවන්ට** සහභාගී විය හැක. රටේ පවතින තත්ත්වය සලකා සෞඛ්‍ය මාර්ගෝපදේශ අනුව ඉදිරියේදි මෙම වැඩසටහන පවත්වනු ලැබේ.

02. ඒ අනුව උක්ත තරගාවලිය පැවැත්වීම සඳහා සියළුම පීයයන් ආවරණය වන පරිදි ඔබ විශ්වවිද්‍යාලයේ අදාල සිසු සිසුවියන් දැනුවත් කර එයට සහභාගී වීමට අවස්ථාව සැලසීමට කටයුතු යොදන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

03. මේ සමඟ උපදෙස් පත්‍රිකාව හා අයදුම් පත්‍රය ඔබ වෙත යොමු කරන අතර, ඒ සඳහා ලබා දෙන සහයෝගය ඉතා අගය කොට සලකමි.

සිරිසෝම ලොකුවිතාන
ලේකම්,
අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය (බ.ප.)



| | කාර්යාලය / அலுவலகம் / Office | ලේකම් / செயலாளர் / Secretary | ගිණුම් / கணக்குகள் / Accounts | සැලසුම් / திட்டமிடல் / Planning | ක්‍රීඩා / விளையாட்டு / Sports | සංස්කෘතික / கலாசாரம் / Cultural |
|---|---|---|---|---|---|---|
| දුරකතන / தொலைபேசி / Phone | 0112 092883<br>0112 093075 | 0112 092873 | 0112 092881<br>0112 093068 | 0112 092869<br>0112 093135 | 0112 092887<br>0112 093097 | 0112 092875<br>0112 093105 |
| ෆැක්ස්/பெக்ஸ்/Fax | 0112 092894 | 0112 092874 | 0112 092880 | 0112 092894 | 0112 092888 | 0112 092894 |
| ඊ මේල් / E-mail / | Moe.wp.gov@gmail.com | | | | | |

# බස්නාහිර පළාත් නිවේදන වැඩමුළුව හා තරඟාවලිය - 2022


බස්නාහිර පළාත් අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය විසින් පළාත් ආධුනික නිවේදක නිවේදිකාවන් දිරිගැන්වීමේ අරමුණින් 2022 වර්ෂයේ පැවැත්වීමට නියමිත

බස්නාහිර පළාත් නිවේදන වැඩමුළුව හා තරඟාවලිය සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ

කණිෂ්ඨ අංශය - 2022 අප්‍රේල් 25 දිනට වයස අවුරුදු 11 සම්පූර්ණ වූ හා වයස අවුරුදු 16 ට අඩු

ජ්‍යෙෂ්ඨ අංශය - 2022 අප්‍රේල් 25 දිනට වයස අවුරුදු 16 සම්පූර්ණ වූ හා වයස අවුරුදු 20 ට අඩු

විවෘත අංශය - වයස අවුරුදු 20 - 35 දක්වා



උපදෙස් පත්‍රිකාව හා අයදුම්පත්‍රය අමාත්‍යාංශයේ වෙබ් අඩවියෙන්

වෙබ් අඩවිය (www.moe.wp.gov.lk)

**අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය 2022 අප්‍රේල් මස 25 දින වේ.**


විමසීම් - රන්දි කොළමුන්න මිය - 071 8272052
කෞමදි මධුභාෂිණී මිය - 070 273065

බස්නාහිර පළාත් අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය,
2 වන මහල, පළාත් සභා කාර්යාල සංකීර්ණය, බත්තරමුල්ල

බස්නාහිර පළාත් අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යාංශය.
மேல் மாகாண கல்வி, கலாசார, கலை, விளையாட்டு மற்றும் இளைஞர் விவகார, மற்றும் தகவல் தொழில்நுட்பவியல் அமைச்சு.
Ministry of Education, Cultural and arts, Sports and Youth affairs and Information Technology - Western Province

2 වන මහල, නව පළාත් සභා කාර්යාල සංකීර්ණය, 204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
2 வது மாடி, புதிய மாகாண சபை அலுவலக வளாகம், 204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல
2nd Floor, New Provincial Office Complex, 204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

මගේ අංකය / எனது இலக்கம் / My Ref. } 5/10/6-2022
ඔබේ අංකය / உமது இலக்கம் / Your Ref. }
දිනය / திகதி / Date } 2022.

## බස්නාහිර පළාත් නිවේදක වැඩමුළුව හා තරගාවලිය 2022

## උපදෙස් පත්‍රිකාව හා අයදුම්පත්‍රය

බස්නාහිර පළාත් අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය මඟින් 2022 නිවේදක වැඩමුළුව හා තරගාවලිය පැවැත්වීමට සැළසුම් කර ඇති අතර ඒ අනුව පහත සඳහන් උපදෙස් හා කොන්දේසි අනුව උක්ත තරගාවලිය වෙනුවෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

තරග කොන්දේසි

1. මේ සඳහා සහභාගී විය හැක්කේ බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිකරුවන් සඳහා පමණි.

   මෙම තරගාවලිය පහත සඳහන් වයස් කාණ්ඩ තුන යටතේ ක්‍රියාත්මක වේ.

   - කණිෂ්ඨ අංශය - 2022.04.25 දිනට වයස අවුරුදු 11 සම්පූර්ණ වූ හා වයස අවුරුදු 16 ට අඩු
   - ජ්‍යෙෂ්ඨ අංශය - 2022.04.25 දිනට වයස අවුරුදු 16 සම්පූර්ණ වූ හා වයස අවුරුදු 20 ට අඩු
   - විවෘත අංශය - වයස අවුරුදු 20 සිට 35 දක්වා

2. පාසල් අයදුම්කරුවෙක් නම් විදුහල්පති /නියෝජ්‍ය විදුහල්පති හා ග්‍රාමනිලධාරි විසින් සහතික කර අයදුම්පත් ඉදිරිපත් කළ යුතු අතර අනෙකුත් සියලුම අයදුම්කරුවන් ග්‍රාමනිලධාරි විසින් සහතික කර අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.
3. විවෘත අංශය සඳහා පාසල් ගුරු මහත්ම මහත්මීන්ට ද සහභාගී විය හැක.

4. සෑම තරගකරුවෙක්ම අයදුම්පත්‍ර යොමු කිරීමේදී ජාතික හැඳුනුම්පත/ වලංගු විදේශ ගමන් බලපත්‍රය/ වලංගු රියදුරු බලපත්‍රය/උප්පැන්න සහතිකයේ පිටපතක් අමුණා එවිය යුතුයි.

5. තරග **සිංහල** මාධ්‍යයෙන් පමණක් පැවැත්වේ.

6. දිස්ත්‍රික් මට්ටමින් තරගකරුවන් තෝරාගැනීමේ දී තමන් කැමති නිවේදනයක් හා විනිශ්චය මණ්ඩලය විසින් ලබා දෙනු ලබන ඉදිරිපත් කිරීමක් සිදු කළ යුතුවේ.(ඉදිරිපත් කිරීම ප්‍රවෘත්ති නිවේදනයක් නොවිය යුතුය.) දිස්ත්‍රික් මට්ටමින් තරගකරුවන් තෝරාගැනීමේ තරග 2022 ජුනි මාසයේ අග දී පැවැත්වෙන අතර තරගය පැවැත්වෙන නිශ්චිත දිනයන් අයදුම්කරුවන් වෙත ඉදිරියේ දි දැනුම් දෙනු ලැබේ.

7. දිස්ත්‍රික් මට්ටමින් මූලික තරග පවත්වා තෝරාගනු ලබන තරගකරුවන් 110 දෙනෙකු සඳහා නිවේදක වැඩමුළුව පවත්වා පළාත් තරගය වෙත ඉදිරිපත් කර ජයග්‍රාහකයින් තෝරාගනු ලැබේ.

8. ජයග්‍රාහකයින් සඳහා සහතික පත්‍ර හා මූල්‍ය ත්‍යාග පිරිනමනු ලැබේ.

9. තරගයට අදාල සියලු ක්‍රියාකාරකම් සෞඛ්‍ය නීති රීති හා මාර්ගෝපදේශයන්ට අනුකූලව පැවැත්වේ.

10. මෙම උපදෙස් පත්‍රිකාව හා අයදුම්පත්‍රය අමාත්‍යාංශයේ www.moe.wp.gov.lk දරන වෙබ් අඩවිය මගින් ද ලබා ගත හැකිය.

11. අයදුම්පත් යොමු කිරීම
- ඔබ විසින් සහතික කර සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය පැහැදිලිව ලබා ගත හැකි පරිදි SCAN කර announcingwp@gmail.com විද්‍යුත් ලිපිනයට යොමුකිරීම.

හෝ

- ඔබ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ බස්නාහිර පළාත් සංස්කෘතික නිලධාරි වෙත බාරදීම.

හෝ

- ලියාපදිංචි තැපැලෙන් යොමුකිරීම.
මෙහි දී අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙලවරේ බස්නාහිර පළාත් නිවේදක තරගාවලිය 2022 යනුවෙන් සඳහන් කර පහත ලිපිනයට යොමුකිරීම.

ලේකම්
බස්නාහිර පළාත් අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය,
02 මහල,
නව පළාත් සභා කාර්යාල සංකීර්ණය,
204,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

12. අයදුම්පත් 2022.04.25 දිනට පෙර එවිය යුතුය.

විමසීම් : රන්දි කොළමුන්න මිය - 0718272052
කෞමදී මධුභාෂිණී මිය - 0702730651

- වැඩිදුර තරග විස්තර සඳහා ඔබට අයත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ බස්නාහිර පළාත් සංස්කෘතික නිලධාරී මහතා / මහත්මිය සම්බන්ධ කර ගත හැක.

ලේකම්,

අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය(බ.ප)

කාර්යාල ප්‍රයෝජනය සඳහා

| |
|---|
| |

**බස්නාහිර පළාත් නිවේදන වැඩමුළුව හා තරගාවලිය - 2022**
**බස්නාහිර පළාත් අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය**

ඉදිරිපත් වන තරග ඉසව්ව : .කණිෂ්ඨ [ ] ජ්‍යෙෂ්ඨ [ ] විවෘත [ ]

සම්පූර්ණ නම - ...........................................................................................

...........................................................................................

1) මුලකුරු සමඟ නම - ...........................................................................................

2) ස්ථිර ලිපිනය - ...........................................................................................

...........................................................................................

3) දිස්ත්‍රික්කය - ...........................................................................................

4) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය - ...........................................................................................

5) ග්‍රාම සේවා නිලධාරි කොට්ඨාශය - ...........................................................................................

6) දුරකථන අංකය - නිවස : ............................ ජංගම ................................

Whatsapp ............................

7) උපන් දිනය - ...........................................................................................

8) 2022.04.25 දිනට වයස - අවුරුදු : ...................... මාස: ................. දින: .................

9) ජාතික හැඳුනුම්පත් අංකය - ...........................................................................................

10) අධ්‍යාපනය ලබන පාසල/ විශ්වවිද්‍යාලය/ - ...........................................................................................
උසස් අධ්‍යාපන ආයතනය

11) ඉගෙනුම ලබන ශ්‍රේණිය - ...........................................................................................

බස්නාහිර පළාත් සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය විසින් සංවිධානය කරනු ලබන නිවේදන වැඩමුළුව හා තරගාවලිය සඳහා මා විසින් ඉදිරිපත් කළ ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බවත්, මෙම තරගයට අදාල බස්නාහිර පළාත් සංස්කෘතික අමාත්‍යාංශයේ නීති රීති හා තීරණවලට එකඟ වන බවත්, මින් ප්‍රකෘශ කරමි.

.......................................
දිනය

.......................................
අයදුම්කරුගේ අත්සන

---

**පාසල් තරගකරුවන්ගේ තොරතුරු තහවුරු කිරීම**

ඉහත නම් සඳහන් ශිෂ්‍යයා/ශිෂ්‍යාව අප විදුහලේ...........ශ්‍රේණියේ ඉගෙනුම ලබන බවට හා අයදුම්කරු විසින් ලබා දී ඇති ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බව සහතික කරමි.

.............................................................
විදුහල්පති / නියෝජ්‍ය විදුහල්පතිගේ අත්සන හා නිල මුද්‍රාව

---

**පදිංචිය තහවුරු කිරීම (සියලුම අයදුම්කරුවන් සඳහා)**

.......................................................................යන අය......................................................................... ලිපිනයේ පදිංචි බවට සහතික කරමි.

.................................
ග්‍රාම නිලධාරි

බස්නාහිර පළාත් අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යාංශය.

மேல் மாகாண கல்வி, கலாசார, கலை, விளையாட்டு மற்றும் இளைஞர் விவகார, மற்றும் தகவல் தொழில்நுட்பவியல் அமைச்சு.

**Ministry of Education, Cultural and arts, Sports and Youth affairs and Information Technology - Western Province**


2 වන මහල, නව පළාත් සභා කාර්යාල සංකීර්ණය, 204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.

2 வது மாடி, புதிய மாகாண சபை அலுவலக வளாகம், 204, டென்ஸில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.

2nd Floor, New Provincial Office Complex, 204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.



07 MAR 2022

VICE


| | | | | |
|---|---|---|---|---|
| මගේ අංකය / எனது இலக்கம் / My Ref. | 5/9/5 | ඔබේ අංකය / உனது இலக்கம் / Your Ref. | දිනය / திகதி / Date | 2022.02. 19 |

උපකුලපති,

ශ්‍රී ජයවර්ධනපුර.............. විශ්වවිද්‍යාලය,

නුගේගොඩ.........

සියලුම පීඨාධිපතීන්
8/3

**<u>බස්නාහිර පළාත් යොවුන් ලේඛක තරගාවලිය 2022 - විශ්වවිද්‍යාල දැනුවත් කිරීම</u>**

බස්නාහිර පළාත් යොවුන් ලේඛක ලේඛිකාවන් දිරිගැන්වීමේ අරමුණ ඇතිව බස්නාහිර පළාත් යොවුන් ලේඛක තරගාවලිය 2022 වසරේදී ද පැවැත්වීමට බස්නාහිර පළාත් සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය සැලසුම් කර ඇත. මේ සඳහා බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචි වයස අවුරුදු 16-35 අතර තරගකරුවන්ට සහභාගී විය හැක.

02. ඒ අනුව 2022 වර්ෂයේද උක්ත තරගාවලිය සිංහල මාධ්‍යයෙන් පැවැත්වීමට කටයුතු යොදා ඇති අතර, මේ සඳහා සියළුම පීඨයන් ආවරණය වන පරිදි ඔබ විශ්වවිද්‍යාලයේ අදාල සිසු සිසුවියන් සහභාගී කරවීමට කටයුතු යොදන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

03. මේ සමඟ උපදෙස් පත්‍රිකාව ද ඔබ වෙත යොමු කරමි.

04. මේ සඳහා ලබා දෙන සහයෝගය ඉතා අගය කොට සලකමි.

සිරිසෝම ලොකුවිතාන

ලේකම්

අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය (බ.ප.)



| | කාර්යාලය / அலுவலகம் / Office | ලේකම් / செயலாளர் / Secretary | ගිණුම් / கணக்குகள் / Accounts | සැලසුම් / திட்டமிடல் / Planning | ක්‍රීඩා / விளையாட்டு / Sports | සංස්කෘතික / கலாசாரம் / Cultural |
|---|---|---|---|---|---|---|
| දුරකතන / தொலைபேசி / Phone | 0112 092883<br>0112 093075 | 0112 092873 | 0112 092881<br>0112 093068 | 0112 092869<br>0112 093135 | 0112 092887<br>0112 093097 | 0112 092875<br>0112 093105 |
| ෆැක්ස්/பெக்ஸ்/Fax | 0112 092894 | 0112 092874 | 0112 092880 | 0112 092894 | 0112 092888 | 0112 092894 |
| ඊ මේල් / E-mail / | moe.wp.gov@gmail.com | | වෙබ් ලිපිනය/இணையதளம்/WebSite | | www.moe.wp.gov.lk | |

## බස්නාහිර පළාත් යොවුන් ලේඛක තරගාවලිය 2022
## තරග විස්තර පත්‍රිකාව

බස්නාහිර පළාත් යොවුන් ලේඛකයන් දිරි ගැන්වීමේ අරමුණ ඇතිව සාහිත්‍ය තරගාවලියක් පැවැත්වීමට බස්නාහිර පළාත් සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය සැලසුම් කර ඇත. මේ සඳහා බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචි වයස අවුරුදු 16-35 අතර තරගකරුවන්ට සහභාගි විය හැකිය. සිංහල මාධ්‍යයෙන් පමණක් තරග නිර්මාණ භාර ගනු ලැබේ.

### තරග අංකය හා තරග නාමය

තරග අංකය - 1
යොවුන් නවකතා තරගය
(වචන 20,000 - 25,000 අතර)

තරග අංකය - 2
යොවුන් කෙටිකතා තරගය
(වචන 1000-1500 අතර)

තරග අංකය - 3
යොවුන් පද්‍ය (නිසඳැස්) තරගය
(පේළි 40-60අතර)

තරග අංකය - 4
යොවුන් පද්‍ය(සඳැස්) තරගය
(පේළි 40-60අතර)

තරග අංකය - 5
යොවුන් ගී පද රචනා තරගය
(ගායනයට සුදුසු වචන සංඛ්‍යාවක්)

### විස්තර හා කොන්දේසි

1. එක් තරගකරුවකුට එක් තරග අංශයක් සඳහා ඉදිරිපත් කළ හැක්කේ එක් නිර්මාණයක් පමණි. එහෙත් තරග එකකට වඩා වැඩි ගණනකට නිර්මාණ ඉදිරිපත් කළ හැකිය.

2. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 16 - 35 අතර විය යුතුය. වයස තහවුරු කිරීම සඳහා **උප්පැන්න සහතිකයේ පිටපතක් හෝ හැඳුනුම්පතෙහි පිටපතක් තමා විසින්ම සහතික කර නිර්මාණය සමඟ යොමු කිරීම අනිවාර්ය වේ.**

3. සියලු නිර්මාණ ස්වතන්ත්‍ර විය යුතු අතර මොනම ආකාරයකින් හෝ වෙනත් නිර්මාණයකින් උපුටා ගත් හෝ අනුවර්තනය කර ගත් හෝ ඇසුරු කර ගත් නිර්මාණයක් නොවිය යුතුය. එසේම මෙයට පෙර කිසිදු ආකාරයකින් හෝ ප්‍රකාශයට පත් වී නොමැති නිර්මාණයක් විය යුතුය. ඒ සඳහා තරගකරු විසින්ම තම නිර්මාණය ස්ව නිර්මාණයක් බව අයදුම්පත්‍රයේ තහවුරු කළ යුතුය.

4. අයදුම්පතෙහි පදිංචිය පිළිබඳ තොරතුරු ග්‍රාම නිලධාරී මඟින් සහතික කර එවිය යුතු අතර නොඑසේනම් පදිංචිය පිළිබඳ මෑතකදී ලබා ගත් ග්‍රාම නිලධාරී සහතිකයක් අයදුම්පත සමඟ එවිය යුතුය.

5. සෑම නිර්මාණයක්ම A4 ප්‍රමාණයේ කඩදාසිවල තනි පිටුවේ පැහැදිලි අත් අකුරින් ලියා හෝ පරිගණක මඟින් සකසා හෝ තිබිය යුතුය.

6. සෑම නිර්මාණයක් සමගම අයදුම්පතක් අමුණා එවිය යුතුය. තරගකරුගේ අනන්‍යතාව දැක්වෙන කිසිදු සලකුණක් නිර්මාණ අත්පිටපත්වල නොතිබිය යුතුය.(ආදර්ශ අයදුම්පත පහත දැක්වේ.)

7. අයදුම්කරුවෙකු අංශ කිහිපයක් සඳහා නිර්මාණ යොමු කරන්නේනම් එහි පිටපත් වෙන් වෙන්ව එවිය යුතුය.

8. නිර්මාණ එවීමේ දී මුල් පිටපත එවීම අවශ්‍ය නොවන අතර, නිර්මාණය පිටපත් තුනකින් එවිය යුතුය. තෝරා නොගන්නා පිටපත් ආපසු එවීමට සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය කටයුතු කරනු නොලැබේ.

9. සෑම තරගයකින්ම ප්‍රථම, දෙවන, තෙවන ස්ථාන සහ ප්‍රශස්ත ඇගයීම් සඳහා ස්ථාන හත බැගින් තෝරා සම්මාන හා මුදල් ත්‍යාග පිරිනැමීමට කටයුතු කර ඇත.

10. නිර්මාණ භාර ගන්නා අවසාන දිනය 2022 මැයි 31 දින වේ. එදිනට හෝ එයට පෙර ලැබෙන ලෙස පහත සඳහන් ලිපිනයට නිර්මාණ ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ ගෙනවිත් බාර දීම සිදු කළ යුතුය. නිර්මාණ භාරදීමේ දී ලියුම් කවරයේ වම් පස ඉහළ කෙලවරේ බස්නාහිර පළාත් යොවුන් ලේඛක තරගාවලිය 2022 යනුවෙන් සඳහන් කොට ඉදිරිපත් වන තරගයේ නමද සඳහන් කළ යුතුයි.

ලේකම්,
අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය,
බස්නාහිර පළාත,
නො.204,
02 වන මහළ,
නව පළාත් සභා කාර්යාල සංකීර්ණය,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල

11. බස්නාහිර පළාත් යොවුන් ලේඛක තරගාවලිය සම්බන්ධයෙන් විනිශ්චය මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වේ.

12. බස්නාහිර පළාත් යොවුන් ලේඛක තරගාවලිය පිළිබඳ වැඩිදුර විස්තර දැන ගැනිම සඳහා නිශාන්ත ලියනගේ මයා, සංස්කෘතික නිළධාරී 078-2420493 දුරකතන අංකය ඔස්සේ සම්බන්ධ කර ගත හැකිය.

.......................................

සිරිසෝම ලොකුවිතාන
ලේකම්,
අධ්‍යාපන , සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය,
බස්නාහිර පළාත.

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා

## බස්නාහිර පළාත් යොවුන් ලේඛක තරගාවලිය 2022

### ආදර්ශ අයදුම් පත්‍රය

01. තරගයේ නම හා අංකය :-..........................................................................................

02. නිර්මාණයේ නම :-..........................................................................................

03. තරගකරුගේ සම්පූර්ණ නම (සිංහලෙන්) :-..........................................................................................

04. මුලකුරු සමඟ නම (සිංහලෙන්) :-..........................................................................................

05. මුලකුරු සමඟ නම (ඉංග්‍රීසියෙන්) :-..........................................................................................

06. සාහිත්‍ය කාර්යයේදී භාවිතා කරන නම :-..........................................................................................

07. ස්ථිර තැපැල් ලිපිනය :-..........................................................................................

08. දිස්ත්‍රික්කය :-................................ ප්‍රාලේ.කොට්ඨාසය.................................

09. උපන්දිනය :-..........................................................................................

10. හැඳුනුම්පත් අංකය :-..........................................................................................

11. 2022.05.31 දිනට වයස :- අවු.................මාස.................දින...............

( උප්පැන්න සහතිකයේ පිටපතක් හෝ හැඳුනුම්පතෙහි පිටපතක් අමුණා එවිය යුතුය)

12. ස්ත්‍රී/පුරුෂ භාවය :-..........................................................................................

13. පාසල/විශ්ව විද්‍යාලය/රැකියා ස්ථානය(අදාල පරිදි) :-..........................................................................

14. විද්‍යුත් තැපැල් ලිපිනය :-..........................................................................................

15. දුරකථන අංකය :-..........................................................................................

16. වට්සැප් අංකය :-..........................................................................................

17. නිර්මාණය පිටපත් තුනකින් ඉදිරිපත් කර තිබේද? :- ඔව් / නැත

18. මීට පෙර ඔබේ නමින් නිර්මාණයක් පළ කර තිබේද? :- ඔව් / නැත

19. ඔව් නම් එම නිර්මාණයේ නම :-..........................................................................................

ඉහත නිර්මාණය මාගේ ස්ව නිර්මාණයක් බවත් එකී නිර්මාණය තුළ මාගේ අනන්‍යතාවය පිළිඹිබු කරන කිසිදු සලකුණක් ඉදිරිපත් කර නොමැති අතර මෙම තරගාවලිය සම්බන්ධයෙන් විනිශ්චය මණ්ඩලයේ තීරණය අවසාන තීරණය බව පිළිගනිමි.

නිර්මාණකරුගේ අත්සන ..............................................

(2 වන පිටුවට )

**පදිංචිය පිළිබඳ ග්‍රාම නිලධාරී සහතිකය :**

**බස්නාහිර පළාත් යොවුන් ලේඛක තරගාවලිය සඳහා ඉදිරිපත් වන ........................................................... යන නිර්මාණකරු .................................................................... ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ .................................................. ග්‍රාම නිලධාරී වසමේ ස්ථිර පදිංචි අයෙකු බව සහතික කරමි.**

**අත්සන හා නිල මුද්‍රාව : ...................................**

**දිනය :....................................**

---

**<u>කාර්යාලීය ප්‍රයෝජනය සඳහා</u>**

**කමිටු නිර්දේශය:**

**අයදුම්කරුගේ තොරතුරු මත පදනම්ව අයදුම්පත නිර්දේශ කරමි / නොකරමි.**

**නිර්දේශකරන්නාගේ අත්සන : ....................................**

**දිනය :....................................**